# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 9 ශ්‍රේණිය

## නර්තනය කාලය : පැය 2

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1) උඩරට වන්නමක කොටස් ගණන වන්නේ,

i) තුනකි iii) පහකි
ii) හතරකි iv) හයකි

2) ගොයම් කැපීමේ නැටුම සඳහා භාවිතා කරන රංග උපකරණයකි.

i) කුල්ල iii) උදැල්ල
ii) දෑකැත්ත iv) නඟුල

3) දේශීය නර්තන සම්ප්‍රදායන්හි මූලික ඉරියව්ව වන්නේ,

i) මණ්ඩියයි iii) අත් සරඹයි
ii) පා සරඹයි iv) නම සරඹයි

4) සිත කම්පා කරවන සිද්ධියක් අසන්නට හෝ දකින්නට ලැබීම අප සිත් තුළ උපදින භාවය,

i) හාස්‍ය iii) භය
ii) ශෝකය iv) සතුට

5) ශාන්ති කර්ම හා සබැඳි මෙන්ම අතීතයේ විනෝදාස්වාදය සඳහා නිර්මාණය වූවකි.

i) පන් නෙළීම iii) චාමර
ii) ගොයම් iv) පතුරු

6) 'වියා පැදුර පන් කපමින් ගෙන එවිට' මෙය,

i) ගොයම් නෙළීමේ කවියකි. iii) පන් කැපීමේ කවියකි.
ii) පන් නෙළීමේ කවියකි. iv) ගොයම් කැපීමේ කවියකි.

7) 8 වන ගොඩ සරඹයේ හරඹ නාමය වන්නේ,

i) දැල සරඹයයි iii) අර්ධචක්‍ර සරඹයයි
ii) අංගහාර සරඹයයි iv) දෑත පෑගීමේ සරඹයයි

8) උඩරට - පහතරට - සබරගමුව සම්ප්‍රදායන් තුනටම පොදු වූ බෞද්ධ මුහුණුවරක් ගත් ගායනා විශේෂයකි.

i) කඩතුරා කවි iii) සවරං කවි
ii) පතුරු කවි iv) මල්යහන් කවි

9) සතර බීජාක්ෂර ............... වේ.

i) තත් තත් ජිත් තං iii) තත් ජිත් තොං තං
ii) තත් තත් හොංනං iv) තත් තොං ජිත් තං

10) "දුරජා බැලුම නොව ළඟත් බලන අය ............... " මෙම ගායනය,

i) හනුමා වන්නමට අයත්ය.
ii) සිංහරාජ වන්නමට අයත්ය.
iii) වෛරොඩි වන්නමට අයත්ය.
iv) තුරඟා වන්නමට අයත්ය.

11) "නහලම් තල බෙර තම්මැට පට තන්තිරි බමරු ............... " මෙහි සඳහන් වාද්‍ය භාණ්ඩ නාමාවලිය දැකිය හැක්කේ,

i) තිසර සන්දේශයේ ය.
ii) සැවුල් සන්දේශයේ ය.
iii) හංස සන්දේශයේ ය.
iv) සැළලිහිනි සන්දේශයේ ය.

12) සාමූහිත බව හා සරල බව යන ප්‍රධාන ලක්‍ෂණ දැකිය හැකි වන්නේ,

i) ශාස්ත්‍රීය නැටුම් වලය
ii) ගැමි නැටුම් වලය
iii) වන්නම් වලය
iv) නිර්මාණ වලය

13) ගැට බෙරයේ දකුණු ඇස වැසීම සඳහා යොදාගනු ලබන්නේ,

i) කන්වරයයි
ii) ගැටි වලයි
iii) හැක්මයි
iv) සුරත් තට්ටුවයි

14) තාලයක් නිර්මාණය කිරීමට අවශ්‍ය අවම මාත්‍රා ගණන වන්නේ,

i) 2 + 2
ii) 3 + 3
iii) 4 + 4
iv) 6 + 6

15) මාත්‍රා 1 2 3 4 / 1 2 3 4 තාලය හා මාත්‍රා 1 2 / 1 2 3 තාලයට නර්තන කෙරෙන වන්නම් දෙකකි.

i) හනුමා / තුරඟා
ii) සිංහරාජ / තුරඟා
iii) තුරඟා / සිංහරාජ
iv) වෛරොඩි / තුරඟා

16) තකට ........ තා දොංගඩ තරිකිට ....... තා ගැලපෙන පිළිතුර හිස්තැනට යොදන්න.

i) තරිකිට / තකට
ii) දොදොං / තකට
iii) දොදොං / තරිකිට
iv) දොදොං / තකට දොදොං

17) "දොදොංත තකු දොං" මෙම බෙර පදය,

i) තුරඟා වන්නමට අයත් ය.
ii) සිංහරාජ වන්නමට අයත් ය.
iii) වෛරොඩි වන්නමට අයත් ය.
iv) හනුමා වන්නමට අයත් ය.

18) මැටි කැපීම, පෑගීම, පදම් කිරීම...... ආදී ක්‍රියාකාරකම් දැකිය හැකි කර්මාන්තය වන්නේ,

i) ධීවර කර්මාන්තය
ii) කුඹල් කර්මාන්තය
iii) ගොවිතැන ආශ්‍රිත කර්මාන්තය
iv) තේ කර්මාන්තය

19) ආඝාතය තැබීමෙන් පසු ගායනය ආරම්භ කිරීම හඳුන්වනු ලබන්නේ,

i) අවග්‍රහ
ii) සමග්‍රහ
iii) විෂමග්‍රහ
iv) ග්‍රහ කවි

20) ගොඩ සරඹ හමාර කිරීම සිදු කරන්නේ,

i) මහාර පදයෙනි
ii) කස්තිරමෙනි
iii) සීරු මාරුවෙනි
iv) ඉරට්ටෙනි

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(1)

i) ගැට බෙරය වාදනය කරන අවස්ථාවන් දෙකක් නම් කරන්න. (ල. 2)

ii) බෙරය සකස් කිරීමට ගන්නා දැව වර්ග තුනක් නම් කරන්න. (ල. 2)

iii) ගැට බෙරයක දළ රූප සටහනක් අඳින්න. (ල. 3)

iv) බෙරයේ කොටස් තුනක් නම් කරන්න. (ල. 2)

v) බෙරයේ දකුණු ඇස වසා තබන පියන හඳුන්වන නාමය සහ දෙඇස් (වම සහ දකුණ) ඇද තබා හඬ සකස් කිරීමට උපයෝගී කර ගන්නා පටි හඳුන්වන නාමය ලියන්න. (ල. 3)

(2)

i) මාත්‍රා 3+3 තනි තිතට අදාල කෙටි කස්තිරමක් ලියන්න.

ii) මාත්‍රා 4+4 තනි තිතට බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

iii) වෛරොඩි වන්නමේ අඩව්ව නියමිත කාල රූපයට ප්‍රස්තාර කරන්න.

$3 \times 4 = 12$

(3)

i) ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා ස්වස්ථතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක දක්වන්න.

ii) මානසික නීරෝගීකම  පවත්වා ගැනීම සඳහා බලපාන කරුණු තුනක් ලියා දක්වන්න.

iii) නර්තනය, ශාරීරික හා මානසික සවස්ථතාව කෙරෙහි බලපාන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

$3 \times 4 = 12$

(4)

i) රංග උපකරණයක් නිර්මාණය කිරීම සඳහා පරිසරයෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය තුනක් නම් කරන්න.

ii) එකී අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිර්මාණය කළ හැකි රංග භාණ්ඩ තුනක් නම් කරන්න.

iii) එම රංග භාණ්ඩයක් නිර්මාණය කළ ආකාරය පැහැදිලි කරන්න.

$3 \times 4 = 12$

(5)

i) සෙල්ලිපි ඇතුළත් යුග නම් කරන්න.

ii) සැස් සේරුව හා කොරවක්ගල ලෙන් ලිපිවල දක්වා ඇති කරුණු පැහැදිලි කරන්න.

iii) ගම්පොළ යුගයේ ලියැවුණු වාද්‍ය භාණ්ඩ සඳහන් ගායනයක කොටසක් හෝ නර්තනය පිළිබඳ සඳහන් ගායනයක කොටසක් ලියා දක්වන්න.

$3 \times 4 = 12$

(6)

i) පත් නෙළීමේ කවියක් හා ගොයම් කවියක් ලියා දක්වන්න.

ii) වෙහෙස මහන්සිය විඩාව පාළුව මඟ හරවා ගැනීමට ගායනා කළ කවියක් ලියා දක්වන්න.

iii) ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම හා ඔවුන් තුළ පවතින විශ්වාස හුවා දැක්වීම සඳහා සරල බස් වහරක් උපයෝගී කරගත් ගායනයක් ලියන්න.

$3 \times 4 = 12$